# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1866/6 - 2014 ජුනි මස 10 වැනි අඟහරුවාදා - 2014.06.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නිවේදනයයි

1985 අංක 48 දරන පනතින් හා 1987 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 (3), 14 සහ 20 වැනි වගන්තියෙන් ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවන ලද පහතින් දැක්වෙන *ගැසට් නිවේදනයන්* හි සඳහන් රෙගුලාසි පාර්ලිමේන්තුවේ සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. එම්. එස්. බටගොඩ,
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.

2014 මැයි මස 30 වැනි දින,
කොළඹ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ සම්මත කිරීම**

01. ආනයන පාලනයට යටත් භාණ්ඩ ලැයිස්තුව ප්‍රසිද්ධ කරමින් 2013.06.05 වැනි දින නිකුත් කරන ලද අංක 1813/14 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* 2013.07.09 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

02. අපනයනය කරනු ලබන කුරුඳු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර අනිවාර්ය කරමින් 2013.06.05 වැනි දින නිකුත් කරන ලද අංක 1813/15 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* 2013.07.09 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

03. සහල් අපනයනය සීමා කිරීමට පනවන ලද 2012 ජුනි මස 27 වන දින නිකුත් කරන ලද 1764/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* පරිච්ඡින්න කරමින් 2013.07.18 දිනැතිව නිකුත් කරන ලද 1819/32 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* 2013.08.22 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

04. හයිඩ්‍රෝ ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් (HCFC) ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම පාලනය කරමින් 2013.08.01 වන දින නිකුත් කරන ලද 1821/40 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* 2013.09.03 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

05. මගී ප්‍රවාහනය සහ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළට ආනයනය කරන වාහන සම්බන්ධයෙන් පවතින සංයෝජිත වර්ගීකරණ අංකයන් ඉවත් කරමින් හා අළුතින් සංයෝජිත වර්ගීකරණ අංකයන් ඇතුළත් කරමින් 2013.11.21 වැනි දින නිකුත් කරන ලද 1837/41 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* 2013.12.20 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

06. අපනයනය කරනු ලබන කුරුඳු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර අනිවාර්යය කරමින් 2013.06.05 වැනි දින නිකුත් කරන ලද අංක 1813/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* ප්‍රකාරව එහි ක්‍රියාත්මක දිනය සංශෝධනය කරමින් 2014.01.02 නිකුත් කරන ලද 1843/40 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* 2014.01.22 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

07. ආනයනික භාණ්ඩ 123 ක් සඳහා ප්‍රමිති පිරිවිතර අනිවාර්යය කරමින් 2014.01.08 වන දිනැතිව නිකුත් කරන ලද අංක 1844/49 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* 2014.01.22 පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

08. භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළට ආනයනය කරන වාහන සම්බන්ධයෙන් පවතින සංයෝජිත වර්ගීකරණ අංකයන් ඉවත් කරමින් හා අළුතෙන් සංයෝජිත වර්ගීකරණ අංකයන් ඇතුලත් කරමින් 2014.01.21 වන දින නිකුත් කරන ලද 1846/16 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* 2014.03.04 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව ;

06 - 730

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.